# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1739/7 - 2012 ජනවාරි 03 වැනි අඟහරුවාදා - 2012.01.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

විසර්ජන ප්‍රඥප්තිය - 2012

**සබරගමුව පළාතේ පළාත් සභාව විසර්ජන ප්‍රඥප්තිය අංක 05 - 2011**

2012 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමටත් විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2011 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

2\. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ ප්‍රඥප්තියෙහි "2012 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන, 2012 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2012 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් මිලියන දහසය දහස් තුන්සිය පහකුත් තුන්සිය විසිහතර දහසක් (රු. 16,305,324,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් :- 2012 මුදල් වර්ෂය සඳහා විසර්ජන

(අ) සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින් ; හා

(ආ) සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබාගන්නා මුදල් වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින් පියවිය යුතු ය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් මිලියන දහසය දහස් තුන්සිය පහකුත් තුන්සිය විසිහතර දහසක් (රු. 16,305,324,000) වූ මුදල මේ ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා හා එය වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධාන වලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

2012 මුදල් වර්ෂය සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම.

3. (1) 2012 මුදල් වර්ෂය තුළදී, මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වැනි තීරුවේ සඳහන් ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම් වල සමස්ථය, VI වැනි තීරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එසේ ලැබෙන ශුද්ධ අතිරික්තයක් වේ නම් එය 2012 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර සබරගමුව පළාත් සභා අරමුදලට ගෙවිය යුතුය.

(2) 1 වැනි උප වගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

(අ) කිසියම් කටයුත්තක ආදායමට අයවිය යුතුව නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපනය හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තක ආදායමින් අඩු කළ යුතු ය.

4. මේ ප්‍රඥප්තියෙහි දෙවැනි උපලේඛනයේ IV වැනි තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2012 මුදල වර්ෂය තුළ සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන වියදම්. ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව ලබන ලැබීම් වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතු ය.

5. මේ ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ IV වැනි තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2012 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතු ය. තවද, එම මුදල් වර්ෂය අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් VIII වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතු ය.

2012 මුදල් වර්ෂය තුළදී 3 වැනි වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ සබරගමුව පළාත් සභාව විසින් සුදුස්සක් කළහැකි වෙනත් අරමුදලකින් නැතහොත් මුදල් වලින් අත්තිකාරම් ගෙවීම.

6. 2012 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යැයි අමාත්‍යවරයා සළකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ සබරගමුව පළාත් සභාව විසින් සුදුස්සක් කළහැකි හෝ වෙනත් අරමුදලක් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල් වල සමස්ථය එම උපලේඛනයේ V වැනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්ම විය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

වැඩ සටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩ සටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩසටහනකට හෝ මාරු කිරීමේ බලය.

7. (1) මේ ප්‍රඥප්තියේ පළමුවැනි උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම් වලට එම උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දාවූ හෝ මතුවට වියදම් නොකරනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූ ද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩසටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම් වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියකුගේ හෝ නියමය අනුව මාරුකළ හැකි ය.

(2) මේ ප්‍රඥප්තියේ පළමුවැනි උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන් කරන ලද මුදලක් ඒ ශීර්ෂයේ වැඩසටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම් වරයාට පමණක්ම කළ හැකිය.

8. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදු වලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩු වියහැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ සබරගමුව පළාත් සභාව හෝ සුදුස්සක් කළැහකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉවත් කර ගැනීම, අමාත්‍යවරයා විසින් සබරගමුව පළාත් සභාවේ අනුමැතිය ඇතිව කරනු ලැබිය හැකිය.

9. අමාත්‍යවරයා විසින්, සබරගමුව පළාත් සභාවේ අනුමැතිය ඇතිව :- *මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය*

(අ) මේ ප්‍රඥප්තියෙහි දෙවැනි උපලේඛනයේ V වැනි තිරයෙහි, VII වැනි තීරයෙහි සහ VIII වැනි තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්,

(ආ) මේ ප්‍රඥප්තියේ දෙවැනි උපලේඛනයේ VI වැනි තීරයේ දැක්වෙන අවම සීමා ;

නියමයන් මගින් 2013 මැයි මස 31 වැනි දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් සබරගමුව පළාත් සභාව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යැයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතු ය.

10. සබරගමුව පළාත් සභාව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ ප්‍රඥප්තියෙහි දෙවැනි උපලේඛනයෙහි උචිත තිරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ : -

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

*පළමුවැනි උපලේඛනය*

*පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්*

**ශීර්ෂ 800 සිට 861 දක්වා**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් - | රු. 13,750,324,000 |
| ප්‍රාග්ධන වියදම් - | රු. 2,555,000,000 |
| එකතුව - | රු. 16,305,324,000 |

| ශීර්ෂය | වැය විෂය විස්තරය | පුනරාවර්තන වියදම් | ප්‍රාග්ධන වියදම් |
|---|---|---|---|
| 800 | ගරු ආණ්ඩුකාරතුමා<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 46,019,000 | 5,000,000 |
| 801 | පළාත් සභා ලේකම් කාර්යාලය<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 123,913,000 | 1,000,000 |
| 802 | පළාත් රාජ්‍ය සේවා කොමිෂම<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 11,607,000 | 500,000 |
| 803 | සමූපකාර සේවක කොමිෂන් සභාව<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 4,163,000 | - |
| 804 | ප්‍රධාන ලේකම්<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 197,015,000 | 1,108,500,000 |
| 805 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන හා පුහුණු)<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 23,548,000 | - |
| 806 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ)<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 23,942,000 | - |
| 807 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන)<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 14,089,000 | - |
| 808 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)<br>වැඩසටහන 50 ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 119,307,000 | - |
| 809 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව<br>වැඩසටහන 03 පළාත් පරිපාලනය | 33,793,000 | - |
| 810 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති, සංස්කෘතික, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමූපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 88,280,000 | 13,000,000 |
| | වැඩසටහන 47 ප්‍රවාහන සේවා | | 17,000,000 |
| | වැඩසටහන 49 විදුලි බල හා බලශක්ති | | 17,000,000 |
| | වැඩසටහන 55 ආහාර සුරක්ෂිතතා පත්වාගෙන යාම | | 10,000,000 |
| | වැඩසටහන 60 ප්‍රජා සංවර්ධනය | | 133,000,000 |
| | වැඩසටහන 61 නිවාස හා ප්‍රජා පහසුකම් | 4,541,000 | 15,000,000 |

පළමුවැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| ශීර්ෂය | වැය විෂය විස්තරය | පුනරාවර්තන වියදම් | ප්‍රාග්ධන වියදම් |
|---|---|---|---|
| | වැඩසටහන 63 වතු යටිතල පහසුකම් හා වතු නිවාස | | 20,000,000 |
| | වැඩසටහන 80 ප්‍රාථමික අධ්‍යාපනය | | 162,000,000 |
| | වැඩසටහන 81 ද්විතීයික අධ්‍යාපනය | | 302,000,000 |
| | වැඩසටහන 93 ආගමික හා සංස්කෘතික කටයුතු | 2,345,000 | 15,000,000 |
| 811 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 257,303,000 | - |
| | වැඩසටහන 80 ප්‍රාථමික අධ්‍යාපනය | 2,460,630,000 | - |
| | වැඩසටහන 81 ද්විතීයික අධ්‍යාපනය | 5,269,568,000 | - |
| | වැඩසටහන 87 අධ්‍යාපන සහභාගිත්වය වැඩිදියුණු කිරීම | 10,985,000 | - |
| | වැඩසටහන 88 අධ්‍යාපන සැළසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 13,750,000 | - |
| 812 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 60 ප්‍රජා සංවර්ධනය | 951,431,000 | - |
| 813 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 53 සමූපකාර සංවර්ධනය | 60,314,000 | - |
| 820 | පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශය | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 29,825,000 | - |
| | වැඩසටහන 50 ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 225,000,000 | 242,000,000 |
| | වැඩසටහන 52 ප්‍රාදේශීය සංවර්ධනය | - | 43,000,000 |
| | වැඩසටහන 90 විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 28,000,000 |
| 830 | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 27,344,000 | |
| | වැඩසටහන 51 කර්මාන්ත සංවර්ධනය | | 14,000,000 |
| | වැඩසටහන 60 ප්‍රජා සංවර්ධන කටයුතු | 43,665,000 | 7,000,000 |
| | වැඩසටහන 95 සමාජ ආරක්ෂණය | | 36,000,000 |
| 831 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 51 කර්මාන්ත සංවර්ධනය | 102,773,000 | - |
| 832 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 95 සමාජ ආරක්ෂණය | 134,609,000 | - |
| 833 | පරිවාස හා ළමාරක්ෂ දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 95 සමාජ ආරක්ෂණය | 42,058,000 | |
| 840 | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 32,854,000 | 1,700,000 |
| | වැඩසටහන 71 රෝහල් සේවාවන් | | 127,700,000 |
| | වැඩසටහන 72 මහජන සෞඛ්‍ය සේවාවන් | | 60,600,000 |
| | වැඩසටහන 73 දේශීය සෞඛ්‍ය සේවාවන් | | 34,000,000 |
| | වැඩසටහන 96 කාන්තා සංවර්ධනය | | 10,000,000 |
| 841 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 111,389,000 | |

*පළමුවැනි උපලේඛනය (සම්බන්ධිතයි)*

| *ශීර්ෂය* | *වැය විෂය විස්තරය* | *පුනරාවර්තන වියදම්* | *ප්‍රාග්ධන වියදම්* |
|---|---|---|---|
| | වැඩසටහන 71 රෝහල් සේවාවන් | 2,158,763,000 | |
| | වැඩසටහන 72 මහජන සෞඛ්‍ය සේවාවන් | 604,196,000 | |
| 842 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 73 දේශීය වෛද්‍ය සේවාවන් | 213,185,000 | |
| 850 | ඉඩම්, පාළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 34,302,000 | 13,000,000 |
| | වැඩසටහන 43 වාරිමාර්ග හා ජල කළමනාකරණය | - | 23,000,000 |
| | වැඩසටහන 44 කෘෂිකාර්මික සංවර්ධනය | - | 47,000,000 |
| | වැඩසටහන 45 පශු සම්පත් සංවර්ධනය | - | 25,000,000 |
| | වැඩසටහන 90 විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 24,000,000 |
| 851 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 40 ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 16,765,000 | - |
| 852 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 44 කෘෂිකර්ම සංවර්ධනය | 118,218,000 | - |
| 853 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 45 පශු සම්පත් සංවර්ධනය | 113,011,000 | - |
| 854 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 90 විනෝද කටයුතු හා ක්‍රීඩා | 12,712,000 | - |
| 861 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | |
| | වැඩසටහන 03 පළාත් පරිපාලනය | 13,112,000 | - |
| | **එකතුව** | **13,750,324,000** | **2,555,000,000** |

*දෙවැනි උපලේඛනය*

*2012 - ඇස්තමේන්තු*

**අත්තිකාරම් ගිණුම් කටයුතු**

**පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**

| *i* | *ii* අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | *iii* විෂය අංකය | *iv* අත්තිකාරම් වර්ගය | *v* උපරිම වියදම් සීමාව | *vi* අවම ලැබීම් සීමාව | *vii* හර ශේෂයේ උපරිම සීමාව | *viii* බැරකම් වල උපරිම සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 1. | ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | 8001 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,000,000 | 450,000 | 4,600,000 | |
| 2. | පළාත් සභා ලේකම් කාර්යාලය | 8011 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,000,000 | 500,000 | 7,000,000 | |
| 3. | පළාත් රාජ්‍ය සේවා කොමිෂම | 8021 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,000,000 | 600,000 | 5,000,000 | |
| 4. | සමූපකාර සේවක කොමිෂන් සභාව | 8031 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,000,000 | 150,000 | 2,000,000 | |
| 5. | ප්‍රධාන ලේකම් | 8041 | පළාත් රා. නි. අත්තිකාරම් | 25,000,000 | 7,500,000 | 70,000,000 | |
| 6. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | 8081 | පළාත් රා. නි. අත්තිකාරම් | 25,000,000 | 5,500,000 | 35,000,000 | |
| 7. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 8091 | පළාත් රා. නි. අත්තිකාරම් | 4,000,000 | 1,000,000 | 9,000,000 | |
| 8. | ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, | | | | | | |

දෙවැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| *i* | *ii* අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | *iii* විෂය අංකය | *iv* අත්තිකාරම් වර්ගය | *v* උපරිම වියදම් සීමාව | *vi* අවම ලැබීම් සීමාව | *vii* හර ශේෂයේ උපරිම සීමාව | *viii* බැරකම් වල උපරිම සීමාව |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රවෘත්ති, සංස්කෘතික, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමූපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | 8101 | පළාත් රා. නි. අත්තිකාරම් | 7,500,000 | 1,500,000 | 16,000,000 | |
| 9. | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 8111 | පළාත් රා. නි. අත්තිකාරම් | 350,000,000 | 200,000,000 | 450,000,000 | |
| 10. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 8121 | පළාත් රා. නි. අත්තිකාරම් | 3,500,000 | 1,200,000 | 7,500,000 | |
| 11. | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 8131 | පළාත් රා. නි. අත්තිකාරම් | 6,000,000 | 2,000,000 | 9,000,000 | |
| 12. | පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශය | 8201 | පළාත් රා. නි. අත්තිකාරම් | 3,000,000 | 1,200,000 | 6,000,000 | |
| 13. | සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | 8301 | | 6,000,000 | 1,800,000 | 10,000,000 | |
| 14. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8311 | පළාත් රා. නි. අත්තිකාරම් | 9,000,000 | 3,600,000 | 10,000,000 | |
| 15. | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 8321 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,000,000 | 300,000 | 2,000,000 | |
| 16. | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 8331 | පළාත් රා. නි. අත්තිකාරම් | 4,000,000 | 1,200,000 | 5,000,000 | |
| 17. | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශය | 8401 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,500,000 | 1,500,000 | 9,000,000 | |
| 18. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 8411 | පළාත් රා. නි. අත්තිකාරම් | 200,000,000 | 55,000,000 | 120,000,000 | |
| 19. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 8421 | පළාත් රා. නි. අත්තිකාරම් | 8,000,000 | 6,000,000 | 18,000,000 | |
| 20. | ඉඩම් පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 8501 | පළාත් රා. නි. අත්තිකාරම් | 3,500,000 | 1,400,000 | 12,000,000 | |
| 21 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 8511 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,200,000 | 700,000 | 3,000,000 | |
| 22. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8521 | පළාත් රා. නි. අත්තිකාරම් | 15,000,000 | 7,200,000 | 20,000,000 | |
| 23. | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 8531 | පළාත් රා. නි. අත්තිකාරම් | 9,500,000 | 3,600,000 | 13,000,000 | |
| 24. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 8541 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,000,000 | 200,000 | 2,000,000 | |
| | උප එකතුව | | | 691,700,000 | 304,100,000 | 845,100,000 | |

**වෙනත් අත්තිකාරම් ගිණුම්**

| *i* | *ii* අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | *iii* විෂය අංකය | *iv* අත්තිකාරම් වර්ගය | *v* උපරිම වියදම් සීමාව | *vi* අවම ලැබීම් සීමාව | *vii* හර ශේෂයේ උපරිම සීමාව | *viii* බැරකම් වල උපරිම සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 25. | පළාත් සභා ලේකම් කාර්යාලය | 8012 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම් | 3,760,000 | 4,224,000 | 13,036,000 | - |
| 26. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | 8082 | කල වැඩ අත්තිකාරම් | 12,500,000 | 5,000,000 | 6,500,000 | 1,000,000 |
| 27. | කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - පුස්සැල්ල | 8052 | පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම් | 2,500,000 | 2,200,000 | 500,000 | |
| 28. | ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති සංස්කෘතික, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමූපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | 8102 | මුද්‍රණාල අත්තිකාරම් ගිණුම් | 3,000,000 | 1,000,000 | 2,800,000 | 500,000 |
| 29. | ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති | 8102 | පරිගනක ව්‍යාපෘතිය | 800,000 | 300,000 | 200,000 | 50,000 |

දෙවැනි උපලේඛනය (සම්බන්ධිතයි)

| *i* | *ii* අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | *iii* විෂය අංකය | *iv* අත්තිකාරම් වර්ගය | *v* උපරිම වියදම් සීමාව සීමාව | *vi* අවම ලැබීම් සීමාව | *vii* හර ශේෂයේ උපරිම උපරිම සීමාව | *viii* බැරකම් වල |
|---|---|---|---|---|---|---|---|
| | සංස්කෘතික, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමූපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර සහ ධීවර කටයුතු අමාතශාංශය | | | | | | |
| 30. | ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන, අධ්‍යාපන හා තොරතුරු තාක්ෂණ, ප්‍රවෘත්ති සංස්කෘතික, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, සමූපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර සහ ධීවර කටයුතු අමාතශාංශය | 8102 | මෙනේරිපිටිය අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන | 3,100,000 | 1,000,000 | 2,000,000 | 100,000 |
| 31. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8312 | පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 15,000,000 | 5,000,000 | 3,000,000 | 1,000,000 |
| 32. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8313 | කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලන | 5,000,000 | 2,500,000 | 2,500,000 | 500,000 |
| 33. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 8422 | පින්නවල පංචකර්ම මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම | 2,800,000 | 3,700,000 | 940,000 | 400,000 |
| | උප එකතුව | | | 48,460,000 | 24,924,000 | 31,476,000 | 3,550,000 |
| | මුළු එකතුව | | | 740,160,000 | 329,024,000 | 876,576,000 | 3,550,000 |

01-424

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.